**එම්.ජී. හරිස්චන්ද්‍රරත්න එ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1113 /2019 (2019.06.25 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - එම්.ජී. හරිස්චන්ද්‍රරත්න
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**පෙනීසිටීම**
අභියාචක - එම්.ජී. හරිස්චන්ද්‍රරත්න
නීතිඥ අසංක දිසානායක
පොදු අධිකාරිය - උපුල් ජයතිස්ස, වැඩබලන අධ්‍යක්ෂ/ තොරතුරු නිලධාරී
බී.එල්.එම්. ඉනාස්, තොරතුරු නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.23 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.12.04 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.30 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.12.10 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.01.21 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.10.23 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

*2016/10/06 දිනැති ප්‍රධාන ක්‍රි. කලාපය (බ.වෙ.) ක්‍රි.කො.පි./ප.බ.ප./2791 ලිපියට අදාළ පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම.*

තොරතුරු නිලධාරියා 2018.12.04 දිනැතිව ප්‍රතිචාර දක්වමින් දන්වා සිටියේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා ගැනීම සඳහා අදාළ කොට්ඨාශයන් (ක්‍රියා කරවන කොට්ඨාශය, මානව සම්පත් කොට්ඨාසය සහ ලේකම් කාර්යාලය) වෙත උපදෙස් ලබා දී ඇති නමුත් අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ඇතුළත් ලිපිගොනුව සොයා ගැනීමට නොහැකි තත්වයක් පවතින බව දන්වා ඇති බවයි. තවද අදාළ ලිපිගොනුව සොයා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීමට පියවර ගෙන ඇති බවත්, අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීමට පනතේ ප්‍රතිපාදනයන්ට අනුව කිසිම නෛතික බාධාවක් නොමැති බවත්ය. නමුත් තොරතුරු දැන ගැනීමේ

අයිතිවාසිකම් පනතේ සඳහන් කාල සීමාව තුළ අදාළ තොරතුරු ලබා දීමට අපහසුතාවයක් පවතින බව දන්වා ඇත. කෙසේ වෙතත් අදාළ විනය ලිපි ගොනුව ලැබුණු විගස අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීමට කටයුතු කරන බව ද දන්වා ඇත.
තොරතුරු නිලධාරියා පනතේ සඳහන් කාල පරාසය තුළ කටයුතු කිරීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2018.11.30 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියා 2018.12.10 දිනැතිව ප්‍රතිචාර දක්වමින් දන්වා සිටියේ තොරතුරු නිලධාරියා දන්වා ඇති පරිදි අභියාචක විසින් ඉල්ලා ඇති පරිදි තොරතුරු ඇතුළත් ලිපිගොනුව සොයා ගැනීමට නොහැකි තත්වයක පවතින බවත් එම ලිපිගොනුව සොයා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව තොරතුරු නිලධාරියාගේ ලිපියේ සඳහන් වන බවත් එබැවින් එම ලිපිගොනුව සොයාගන්නා තෙක් අදාළ තොරතුරු ලබා දීමට ප්‍රමාද වන බවයි. මෙම ප්‍රතිචාරයෙන්ද අතෘප්තියට පත් අභියාචක විසින් 2019.01.21 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගට සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරයි.
මෙහිදී පොදු අධිකාරිය කරුණු දක්වා සිටියේ අදාළ විනය පරීක්ෂණය අවසන් කර ඇති බවත් ඊට අදාළ වාර්තාව අස්ථානගත වී ඇති බවත්ය. එසේම එලෙස අස්ථානගත වූ එම ලිපිගොනුව සමබන්ධව අභියාචක වෙත 2019.01.31 දිනැතිව දැනුවත් කර ඇති බවත්ය.

එසේම එම විනය පරීක්ෂණ ලිපිගොනුව සොයා ගැනීමට නොහැකි වීමෙන් පසුව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරී විසින් එහි වාර්තා පවත්වාගෙන යා යුතු සහ ආරක්ෂා කළ යුතු බවට වන ප්‍රතිපාදනය හා අනුගමය වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලේකම් කාර්යාලයීය චක්‍රලේඛ අංක 16/2019 ලෙස නව චක්‍රලේඛයක් පනවා ඇති බවත් එමඟින් සිය අධිකාරියේ ඇති ලේඛන ආරක්ෂා කිරීමේ වගකීම හා යුතුකම සම්බන්ධව සියලුම සේවකයින් දැනුවත් කර ඇති බවත්ය.

මෙම කරුණු දැක්වීම මත අදාළ ලේඛන ආරක්ෂා කිරීම සම්බන්ධව පොදු අධිකාරිය විසින් ගනු ලැබූ පියවර කොමිෂන් සභාවේ පැසසුමට ලක් වූ අතර මෙය අනෙකුත් පොදු අධිකාරීන් සඳහා පූර්වාදර්ශයක් ලෙස සැලකිය හැකි බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

කෙසේ නමුත් අභියාචක කරුණු දක්වා සිටියේ පොදු අධිකාරියේ ප්‍රතිචාරයෙන් තමන් සෑහීමකට පත් නොවන බවත් අදාළ ලිපිගොනුව පොදු අධිකාරියේ භාරයේ පැවතිය යුතු බවටත් ප්‍රකාශ කර සිටී.

මෙහිදී පොදු අධිකාරිය සඳහන් කර සිටියේ විනය පරීක්ෂණයට අදාළ සම්පූර්ණ ලිපිගොනුවම අස්ථානගත වී ඇති බවය.

මේ සම්බන්ධව කොමිෂන් සභාව අවධාරණය කර සිටියේ අදාළ විමර්ශන වාර්තාවේ පිටපත හෝ අදාළ විමර්ශනය පැවැත්වූ නිලධාරීන් සතුව හෝ පවතින්නේද යන්න පරීක්ෂා කර බලන ලෙසයි.

මීට ප්‍රතිචාර ලෙස පොදු අධිකාරිය කරුණු දක්වා සිටියේ අදාළ විනය පරීක්ෂණයේදී අභියාචක වරදකරු නොවී ඇති අතර තරයේ අවවාද කිරීමක් පමණක් සිදුකර ඇති බවත් විනය පරීක්ෂණය සිදුකළ නිලධාරීන් සතුව හෝ එම වාර්තාවේ පිටපත් පැවතීමට හැකියාවක් නොමැති බවට ප්‍රකාශ කර සිටී.

මෙහිදී අභියාචක විසින් කරුණු දක්වා සිටියේ ඔහු අදාළ විනය පරීක්ෂණයෙන් වරදකරු නොවූවත් ඉහළ නිලයන්ට ප්‍රවර්ධනය වීමේදී මෙම කාරණය දැඩි ලෙස මතභේදයට තුඩුදුන් බවත් එබැවින් මෙම වාර්තාව ලබා ගැනීමේ ඇති වැදගත්කමද අවධාරණය කර සිටින ලදි.

**නියෝගය:**

අදාළ විනය පරීක්ෂණයේ පිටපතක් හෝ එය පැවැත්වූ පරීක්ෂණ නිලධාරින්/නිලධාරියෙකු සතුව ඇත්දැයි පරීක්ෂා කර බැලීමටත් ඒ පිළිබඳව අභියාචක වෙත දැනුම්දීමටත් පොදු අධිකාරියට මින් නියෝග කර සිටී.

මීළඟ අභියාචනා විභාගය 2019.10.15 දින ප.ව. 2.30ට කල්තබන ලදි.

---

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1113 /2019 (2019.10.15 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෝෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෝෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - **එම්.ජී. හරිස්චන්ද්‍රරත්න**
**නොතිසි ලත් පාර්ශවය** - **නම් කළ නිලධාරී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**පෙනීසිටීම**
අභියාචක - **එම්.ජී. හරිස්චන්ද්‍රරත්න**
නීතිඥ අසංක දිසානායක
පොදු අධිකාරිය - උපුල් ජයතිස්ස, වැඩබලන අධ්‍යක්ෂ/ තොරතුරු නිලධාරී
බී.එල්.එම්. ඉනාස්, තොරතුරු නිලධාරී

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගට සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරයි.

මීට පෙර පැවැත්වූ අභියාචනා විභාගයේදී පොදු අධිකාරියට නියෝග කළ පරිදි පොදු අධිකාරිය විසින් අදාළ විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරිනිය වන බී.එම්. අනුලාවතී නැමැත්තියගෙන් අදාළ විනය පරීක්ෂණය පිළිබඳ වාර්තාවේ පිටපතක් හෝ ඇත්ද යන්න විමසීමක් කර ඇති බවත් එහිදී ඇය විසින් ප්‍රතිචාර දක්වා ඇත්තේ

> *"සංඛ්‍යා ලේඛන අංශයේ සේවය කරන ලද එම්.ජී. හරිස්චන්ද්‍රරත්න මහතාට එරෙහිව පැවති විධිමත් විනය පරීක්ෂණය ම විසින් පවත්වා එහි විනය පරීක්ෂණ වාර්තාව සමඟ අදාළ විනය ලිපිගොනුව අධ්‍යක්ෂ (වරාය මෙහෙයුම්) මඟින් කළමනාකර අධ්‍යක්ෂ වෙත එම කාල සීමාව තුලදීම යොමුකර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග, ක්‍රියාකරවන කොට්ඨාසය විසින් ගෙන ඇති අතර එකී විනය පරීක්ෂණ වාර්තාවේ පිටපත් දැන විශ්‍රාමිකව සිටින මා සතුව නොමැති බව දන්වා සිටින බවයි."*

මෙහිදී පොදු අධිකාරිය විසින් සඳහන් කර සිටින ලද්දේ අදාළ විනය පරීක්ෂණයෙන් අභියාචක නිර්දෝෂී බව තහවුරු වී ඇති බවත් ඒ අනුව කිසිදු දඬුවමක් පැනවීමක් සිදු නොකරන ලද බවයි. එසේම උසස්වීම් ලැබීමේදී අභියාචක ඊට සුදුසුම සුදුසුකම් ලත් පුද්ගලයා වන බවත් පොදු අධිකාරිය විසින් පිළිගන්නා ලදි. එසේම පොදු අධිකාරියේ පාර්ශවයෙන් අදාළ විනය පරීක්ෂණ වාර්තාව සුරක්ෂිතව තබා ගැනීමේදී පැහැදිලිවම නොසැලකිල්ලක් සිදුව ඇති බවට පොදු අධිකාරිය විසින්ම පිළිගනු ලබන බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

මෙහිදී අභියාචක විසින් කරුණු දක්වා සිටින ලද්දේ අදාළ පරීක්ෂණ වාර්තාව 2016 වර්ෂයේ ඔක්තෝබර මාසයේදීද පොදු අධිකාරිය සන්තකයේ පැවති බවයි.

පොදු අධිකාරිය විසින් වැඩිදුරටත් සඳහන් කර සිටියේ ඉන්ද්‍රානී නැමැති නිලධාරිනිය විසින් නැවත එම විනය පරීක්ෂණ වාර්තාව ලබාගත් බවත් නමුත් එම විනය පරීක්ෂණ වාර්තාව තමන්ට නොලැබුණු බවත් ඉන් පසුව සේනාරත්න නැමැති කම්කරුවා විසින් එම විනය පරීක්ෂණ වාර්තාව රැගෙන ගොස් ඇති බවත් ඉන් අනතුරුව ඊට සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳව ප්‍රශ්නාර්ථයක් ඇති බවත්ය.

**නියෝගය:**

මෙහිදී අභියාචකට පැහැදිලිවම අසාධාරණයක් සිදුව ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටින අතර අදාළ විනය පරීක්ෂණ වාර්තාව අවසාන වශයෙන් කවරෙකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ පැවතියේද යන්න පිළිබඳව එම ලේඛන රැගෙන යාමේදී අත්සන් කරනු ලබන කාර්යපටිපාටිය හෝ වෙනත් සුදුසු ක්‍රමයක් හරහා අනාවරණය කරගෙන එම විනය පරීක්ෂණ වාර්තාවේ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඒ පිළිබඳ කොමිෂන් සභාවට දන්වන මෙන් පොදු අධිකාරියට මින් නියෝග කර සිටී.

මීළඟ අභියාචනා විභාගය 2020.01.21 දින ප.ව. 3.15 ට කල්තබන ලදි.

---

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1113 /2019 (2020.01.21 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෝෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෝෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | විනිසුරු රෝහිණී වල්ගම |
| **අධ්‍යක්ෂ ජනරාල් :** | වසන්ත හපුආරච්චි |

| | |
|---|---|
| **අභියාචක** | - එම්.ජී. හරිස්චන්ද්‍රරත්න |
| **නොතිසි ලත් පාර්ශවය** | - නම් කළ නිලධාරී, **ශ්‍රී** ලංකා වරාය අධිකාරිය |

**පෙනීසිටීම**

| | | |
|---|---|---|
| අභියාචක | - | නීතිඥ අසංක දිසානායක |
| පොදු අධිකාරිය | - | උපුල් ජයතිස්ස, වැඩබලන අධ්‍යක්ෂ/ තොරතුරු නිලධාරී |
| | | බී.එල්.එම්. ඉනාස්, තොරතුරු නිලධාරී |

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගට සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරයි.

මෙහිදී පොදු අධිකාරිය විසින් කරුණු දක්වා සිටින ලද්දේ විධිමත් විනය පරීක්ෂණ වාර්තාව අස්ථානගතවී ඇති බැවින් එම අස්ථානගතවීම පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරනු ලබන ජේ.ඒ. ඉන්ද්‍රානී මහත්මිය හා පී.ඩබ්ලිව්. සෙනෙවිරත්න යන සේවකයන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර විනය පරීක්ෂණ කටයුතු 2020.01.30 දිනට සිදු කිරීමට නියමිතව ඇති බවයි. අදාළ විනය පරීක්ෂණ කටයුතු අවසන් වූ විගස එහි ප්‍රගතිය පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කිරීමට පියවර ගන්නා බවත් අදාළ සේවකයන් වෙත නිකුත් කර ඇති චෝදනා පත්‍රවල පිටපත් කොමිෂන් සභාවේ දැනගැනීම උදෙසා ඉදිරිපත් කළ අතර එහි පිටපතක් අභියාචක පාර්ශ්වය වෙතද ලබා දෙන ලදි.

**නියෝගය:**

ඒ අනුව අදාළ විනය පරීක්ෂණය පැවැත්වෙන දිනය වන 2020.01.30 දිනයේදී ගනු ලබන පියවර කොමිෂන් සභාවට දැනුවත් කිරීමට පොදු අධිකාරියට නියෝග කර සිටින අතර මේ පිළිබඳ විභාග කිරීම 2020.05.12 වන දින ප.ව. 2.00ට පැවැත්වෙනු ඇත.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****